**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 11 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1(ඇ) | දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.630,000,000 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දක්වා තිබුණද, එම ඉඩම දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි. | 1.6.1(ආ)(i) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් මාසයට අදාළව මාර්ගගත ක්‍රමයට ලද, රාජ්‍ය ආදායමට බැරකළ යුතු රු.5,384,958 ක මුදල හා විභාග ගාස්තු රු.1,726,310 ක මුදල 2022 වර්ෂයේ ආදායම් වශයෙන් හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ලද ආදායම රු.7,111,268 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියට අදාළ වර්ෂයේ ලැබීම් එම වර්ෂයේම ගිණුම් ගත කිරීමට පියවර ගෙන ඇති බව. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති බත්තරමුල්ල පිහිටි හෙක්ටයාර 1.356 ක ඉඩම 2022 දෙසැම්බර් 31 දින වන විටත් | ඉඩම පවරාගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව ඒකාබද්ධ | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොමැති වුව ද එය රු.630,000,000 ක වටිනාකමකට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | |
| **(ii)** | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2020 හා 2021 වර්ෂවල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට පවරා දෙනු ලැබූ පිළිවෙලින් ඇඹිලිපිටිය පල්ලේගම පරණ කඳවුර අංක 20 දරන ස්ථානයේ පිහිටි හෙක්ටයාර 0.0960 ක ඉඩම සහ කොත්මලේ කොට්ඨාශයට අයත් රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි ඇතුලත් හෙක්ටයාර් 0.328 ක ඉඩම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට 2022 වර්ෂය තුලදී ද අපොහොසත් වී තිබුණි. | අයිතිය ලද බවට තහවුරු ලිපිය ලැබීමෙන් පසු වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ඉඩම තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු පැරණි විභාග ප්‍රතිඵල ලේඛන ස්කෑන් කිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමග බැඳීමක් ඇති කරගෙන තිබුණි. 2021 නොවැම්බර් මාසයේ දී ස්කෑන් කිරීමේ නියැදියක් දෙපාර්තමේන්තුවට භාරදී ඇතත් දෙපාර්තමේන්තුව විසින් එහි නිවැරදිතාවය පරීක්ෂා කර එම ආයතනය සමග විධිමත් ගිවිසුමකට ඇතුළත් වීමට කටයුතු නොකිරීම හේතුවෙන්, රු.14,205,500 ක මුදල බැඳීම් ලෙස තවදුරටත් දක්වා තිබුණි. | අදාළ පුද්ගලික ආයතනය මගින් පරිගණක ගත කරන ලද දත්ත නියැදිය පරීක්ෂා කිරීමේදී හඳුනාගත් දෝෂ හේතුවෙන් විධිමත් ගිවිසුමකට එළඹීමට නොහැකි වී ඇති බව. මේ සම්බන්ධයෙන් පත්කළ කමිටුව විසින් නිර්දේශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව වෙත ලබා දී ඇති බව. | නියමිත කාර්යය කාල පමාවකින් තොරව ඉටුකර බැඳීම් වලින් නිදහස් විය යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයට 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.7,591,878 ක මුදල බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2022 දෙසැම්බර් 19 දිනැති ඉන්වොයිසිය සැපයීම් අංශය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2023 ජනවාරි 26 බැවින් 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් වශයෙන් ඇතුළත් කිරීමට නොහැකි වූ බව. | සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිල නිවාස 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,735,046 ක මුදල බැරකම් ලෙස සඳහන් කර නොතිබුණි. | එකඟ වී ඇති බව. | සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛය | - | සියළුම වාහන මාස 12 කට වරක් හෝ කි.මී.25,000 ක ධාවනයකින් පසු ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදු කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන් තුළදී මෙම පරීක්ෂාවන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සකස්කරමින් පවතින බව. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය. |
| **(ii) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | | | | |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | 214,685,262 | සියළුම බැරකම් එම මුදල් වර්ෂය තුළදීම නිරවුල් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | වවුචර් පත් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට පෙර ගෙවීම් කිරීමට නොහැකි වූ බව. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර | 2022 ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු මඟහරවා ගනිමින් 2023 වර්ෂය සඳහා 02/2020 රාජ්‍ය මුදල් | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබූ අතර ඊට අනුරූපව ප්‍රසම්පාදන සැලසුමද සකස් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඇති බව. | |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් පිරිවැය රු.564,320,835 ක් වූ සය මහල් බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේදී ආරම්භ කර 2019 පෙබරවාරි 02 අවසන් කිරීම සඳහා ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර එදින වන විට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පිළිවෙලින් රු.64,858,719 ක් හා රු.304,671,983 ක් වශයෙන් රු.369,530,702 ක් ගෙවීම් කර තිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 91 ක් බවත් ඉදිකිරීම් අධීක්ෂණය සඳහා කමිටුවක් පත්කර මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඉදිකිරීම් කඩිනම් කිරීමට පියවර ගන්නා බව. | ඉදිකිරීමේ ප්‍රමාදයට හේතු සොයා තවදුරටත් ඉදිකිරීම් ප්‍රමාදය වලක්වාගැනීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිල නිවාස 03 ක් මිලදීගැනීම වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවල රු.32,965,888 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද 2022 දෙසැම්බර් 31 දින වනවිටත් විභාග දෙපාර්තමේන්තුවට එම නිල නිවාස වල හිමිකාරීත්වය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. | අවසන් ගෙවීම් සිදුකරමින් පවතින බව හා ඉන් පසු පවරා ගැනීමේ කටයුතු සඳහා යොමුකරන බව. | නිල නිවාස පවරාගැනීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කර පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් | ඉදිරිපත් කිරීමට සූදානම් කරමින් පවතින බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | | |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදිය භාරගැනීම හෝ නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ වියදමට අදාළ වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ උක්ත වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි.<br><br>එසේම ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට කළ හැකි බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුව තුළ වාර්තාවේ දිනය දක්වාම එවැනි තීරණයක් ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සඳහා ඇප ලේඛනයක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රශ්න පත්‍රවල මනා නිමාවක් ලබාගැනීම මගින් විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනීයත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් | මුද්‍රණ යන්ත්‍රය සඳහා කඩදාසි සපයාගැනීමේ අපහසුව ප්‍රශස්ථ විදුලි සැපයුමක් ලබාගැනීමට | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට ගැළපෙන ලෙස පිරිවිතර සකස් කිරීම හා ඊට අදාළව මිලදී ගන්නා |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂා කරගැනීමේ අරමුණින් විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා භාවිතා කරනු ලබන පැරණි යන්ත්‍ර වෙනුවට රු.546,264,452 ක වියදමක් දරා 2018 නොවැම්බර් මාසයේදී වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේදී පැරණි යන්ත්‍ර මගින් 18,881,727ක් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේදී නව යන්ත්‍රය භාවිතා කර ප්‍රශ්න පත්‍ර 690,125 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. එය මුද්‍රිත සමස්ථ ප්‍රශ්න පත්‍රවලින් සියයට 3.5 ක තරම් අඩු ප්‍රතිශතයක් විය. | නොහැකි වීම, තීන්ත ලබාගැනීමට නොහැකි වීම විවිධ තාක්ෂණික ගැටළු හේතුවෙන් මෙම තත්ත්වය උදා වී ඇති බව. | බව තහවුරු කරගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| | තවද එම වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය සඳහා ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා Wrapping Solution කොටස 2018 වර්ෂයේදී රු.8,428,637ක් වැයකර මිලදී ගෙන තිබුණද කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මිලදී ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුවේ දැනට භාවිතා කරන රසභ්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ Wrapping Solution කොටස නොගැලපීම හේතුවෙන් මෙම යන්ත්‍ර කොටස භාවිතයෙන් ප්‍රශ්න පත්‍ර ඇසුරුම් කටයුතු සිදු කිරීමට නොහැකි බව. | මෙම මිලදී ගැනීමෙන් රජයට සිදුවූ අලාභය අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 වර්ෂයේදී මිලදී ගනු ලැබූ වටිනාකම සොයාගත නොහැකි වූ Slitch Master Gathering and wire Stiching machine අංක 32(001279) දරන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදී කොළ ඉවතට හැලීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයෙන් ඉවත් කර ඇත. | යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදී කොළ ඉවතට හැලීම සිදුවීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි බව. | මිලදී ගැනීමට පෙර සක්‍යතා අධ්‍යයනය සිදු කළ යුතු අතර අදාළ කාර්ය සඳහා භාවිතා කළ හැකි තත්ත්වයට පත් කිරීමට මිලදී ගත් ආයතනය සමඟ සාකච්ඡා කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනික විභාග පැවැත්වීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 09 කින් රු.38,203,407 ක් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව | මෙම මුදලින් 2023 ජූලි 30 දින වන විට රු.615,013ක් අය කරගෙන ඇති බවත් | ලිඛිත උපදෙස් භාණ්ඩාගාරය වෙතින් ලබාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | පැවති අතර වියදම් අයකරගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සහිත උපදෙස් ලබාදෙන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුණි. | ඉතිරි මුදල් අයකරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබාගන්නා බව. | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් වෙනත් රාජ්‍ය ආයතන වෙනුවෙන් පවත්වන ලද විභාග සඳහා සම්පූර්ණ මුදලම හෝ අත්තිකාරමක් හෝ ලබා නොගෙන 2021 හා 2022 වර්ෂවල පවත්වන ලද විභාග 10 ක ප්‍රතිඵල නිකුත් කර තිබුණි. | විභාග 2 ක් සඳහා මුදල් අය කරගෙන ඇති බව. | ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර මුදල් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ඔක්තෝබර් 03 දිනැති අංක EST/07/EXAMS/05/2018 දරන ලිපිය මගින් සංශෝධිත නව ගාස්තු පොතෙහි ඡේද අංක 01 ට අනුව රහස්‍ය ලේඛන කටයුතුවල යෙදීම වෙනුවෙන් ගෙවනු ලබන මාසික රහස්‍ය දීමනාව වසරකට මාස 06 ක උපරිමයකට සීමාකර ගෙවිය යුතු වුවද, එම දීමනාව නිලධාරීන්ගේ මාසික වැටුපට එකතු කර මාස 12 ක් සඳහා රු.628,456 ක් ගෙවා තිබුණි. | අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විභාග සහතික පත්‍රවල නාම සංශෝධනය කළ යුතු බවට ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බලා එම නාම සංශෝධනයන් සිදු කළ අවස්ථාවේදීම එම සංශෝධනය වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශේෂඥ උපදෙස් මත දත්ත ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රධාන පරිගණක පද්ධතිය හා මාර්ගගත සේවා පද්ධතිය අන්තර්ජාලය මගින් සම්බන්ධ කර නැත. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මෘදුකාංග දෙපාර්තමේන්තුව සතුව නොමැති බව. | නාම සංශෝධනය කළ අවස්ථාවේම වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැයකර කිලෝ වොට් 250 ක සූර්ය බලශක්ති පද්ධතියක් විභාග දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කර තිබුණ ද නඩත්තු සේවා සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරු සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | වසර 7 ක් දක්වා නඩත්තු අය කිරීමකින් තොරව සේවා ලබාදීමට එකඟ වී ඇති බව. | ලංසු ලියවිලි අනුව අවුරුදු 2 ක් පමණක් නොමිලේ සේවා සපයන බව දක්වා තිබුණි. ඒ හේතුවෙන් නඩත්තු ආයතනය සමඟ සේවා සැපයුම් සඳහා වූ ගිවිසුම් අත්සන් කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 15 ක්, තෘතියික මට්ටමේ නිලධාරීන් 12 ක්, ද්විතියික මට්ටමේ නිලධාරීන් 173 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 18 ක් ලෙස පුරප්පාඩු 218 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීක මට්ටමේ සහ ද්විතියික මට්ටමේ නිලධාරීන් බඳවාගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති බව. දෙපාර්තමේන්තුගත පත්වීම්වලට අදාළව බඳවාගැනීම් කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතින බව හා තාවකාලික ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කර ඇති සේවකයින් 80 කට ස්ථිර පත්වීම් ලිපි ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |